# 6.3.1 තෝරාගත් විදේශීය ශිල්පීනගේ නිර්මාණ රසාස්වාදය කරයි.

- **පැබ්ලෝ පිකාසෝ ශිල්පියාගේ සිතුවම් අගයමු.**

## කියවීම් පත්‍රිකාව

**පැබ්ලෝ පිකාසෝ (1881-1973)**

- යුරෝපීය චිත්‍රකලාවේ ඝනිකවාදී ප්‍රවණතාව ඉදිරිපත් කළ ප්‍රමුඛ චිත්‍ර ශිල්පියා පැබ්ලෝ පිකාසෝ (Pablo Picasso) ලෙස හඳුන්වා දිය හැකි ය.
- ඔහු 20 වන සියවසේ ප්‍රවීණ සිත්තරුන් අතර අද්විතීය ස්ථානයක් හිමි කර ගත් අයෙකි.
- පැබ්ලෝ පිකාසෝගේ පියා චිත්‍ර ගුරුවරයකු වූ අතර පිකාසෝගේ දක්ෂතා හඳුනා ගත් ඔහු තම පුත්‍රයා චිත්‍ර ශිල්පය වෙත යොමු කරනු ලැබී ය.
- පිකාසෝගේ කලා ජීවිතයේ වැදගත් සන්දිස්ථානයක් වන්නේ 1893-1900 දක්වා පැරීසියට ගොස් එහිදී ප්‍රවීණ ශිල්පීන් සමඟ එකට කටයුතු කරමින් ලබන කලා අධ්‍යයනයන් ය.
- එම අධ්‍යයනයන්ගේ ප්‍රතිඵලයක් වශයෙන් ඔහුගේ චිත්‍ර නිර්මාණවලට අයත් විවිධ සීමාවන් දක්නට ලැබේ.

  නිල් යුගය ( Blue Peiod) 1901-1904
  රෝස යුගය (Rose Period) 1905-1906
  ඝනිකවාදී යුගය (Cubism Period ) 1907න් පසු

**නිපුණතා මට්ටම 6.3** : **තෝරාගත් විදේශීය ශිල්පීන්ගේ නිර්මාණ රසාස්වාදය කරයි.**

**ක්‍රියාකාරකම 6.3.1** : **"පැබ්ලෝ පිකාසෝ ශිල්පියාගේ සිතුවම අගයමු"**

- නිල් යුගය හා රෝස යුගය තුළ පැබ්ලෝ පිකාසෝ විසින් අඳින ලද නිර්මාණ සඳහා වස්තු විෂය වූයේ තැන තැන යමින් රඟන නළු නිළියන්, වීදි මිනිසුන්, දුප්පතුන් හා හිඟන්නන් වැනි පුද්ගලයන් ය.
- නිල් යුගය තුළ නිල් වර්ණයන්ගෙන් හා රෝස යුගය තුළ රෝස පැහැති වර්ණ මාලාවන්ගෙන් ද වර්ණ ගැන්වුණු මෙම චිත්‍ර සඳහා යොදා ගත් මානව රූප තාත්වික ශෛලියට සමානුරූපී වේ.
- අප්‍රිකානු මූර්ති හා වෙස් මුහුණුවල ආභාස ලබමින් පිකාසෝ විසින් 1906න් පසු නිර්මාණය කරන ලද කෘතීන් තුළ නව ශෛලීය ලක්ෂණ පිළිබිඹු වේ.
- 1906න් පසුව බිහිවුණ නිර්මාණවල පවත්නා ජ්‍යාමිතික හැඩතල හා පැතලි වර්ණ භාවිතය මෙන්ම බාහිර රේඛාකරණය සහිත රූප, ඝනිකවාදී සම්ප්‍රදායේ අග්‍රගනා නිර්මාණ අතරට ගැනේ.
- ඝනිකවාදී චිත්‍ර කලාව බිහි කළ පිකාසෝගේ එවැනි සුවිශේෂ නිර්මාණ කිහිපයක් පහත දක්වේ.
  - අවිග්නොන්හි යුවතියෝ
  - වයලින් වාදකයා
  - වැලපෙන ස්ත්‍රිය
  - ගුවර්නිකා

## අවිග්නොන්හි යුවතියෝ චිත්‍රය



- ස්පාඤ්ඤ ජාතික පැබ්ලෝ පිකාසෝ විසින් 1907 දී අඳින ලද මෙම සිතුවම අවිග්නොන්හි යුවතියෝ නම් වේ.
- චිත්‍රකලා ඉතිහාසයේ නව නිර්මාණාත්මක ශෛලියක් සමග නව යුගයක් උදා කළ නිර්මාණයකි.
- මෙම සිතුවම ඝනිකවාදී කලා සම්ප්‍රදායයේ මුල්ම නිර්මාණය වශයෙන් හැඳින්වේ.
- අප්‍රිකානු වෙස් මුහුණු හා මූර්තිවල කලා ආභාස මෙම නිර්මාණය සඳහා පදනම් වී ඇත.
- ස්පාඤ්ඤයේ බාර්සිලෝනා නගරයේ අවිග්නොන් නම් විදියේ ජීවත් වූ විදී ස්ත්‍රීන්ගේ (අභිසරු ලියන්ගේ) ජීවිතය මෙම චිත්‍රය සඳහා වස්තු විෂය වී ඇත.
- ස්ත්‍රී රූප 5 කින් සංරචනය වී ඇති අතර එම රූප ඝනික හැඩයන්ගෙන් යුතු වේ.
- මෙම නව නිර්මාණ ශෛලිය ස්ත්‍රීන්ගේ බාහිර කායික සෞන්දර්ය වෙනුවට ඔවුන්ගේ අභ්‍යන්තර ගති ලක්ෂණ මතු කිරීමට උත්සාහ කිරීමක් විය.
- අභිසරුලියන්ගේ හැඟීම් තීව්‍ර ලෙස ඉදිරිපත් කිරීම සඳහා ඝනික හැඩ හා අප්‍රිකානු වෙස් මුහුණුවල ලක්ෂණ මෙම රූප සඳහා භාවිත කර තිබේ.

## ගුවර්නිකා චිත්‍රය



- වෙස්මුහුණුවල දක්වෙන ගැඹුරු කැපීම් සහිත ලක්ෂණ මෙම ස්ත්‍රීන්ගේ මුහුණුවලින් දක්වෙමින් මානසික ප්‍රතිවිරෝධී තත්ත්ව හා චිත්ත සන්තාප මනාව නිරූපණය කර ඇත.
- ශාස්ත්‍රාලයීය යථාර්ථවාදී කලාවේ දකිය හැකි පර්යාලෝකය හා ත්‍රිමාන ලක්ෂණ වෙනුවට විෂයානුබද්ධ ව නිරූපිත පර්යාලෝකය හා ත්‍රිමාන ලක්ෂණ මෙම නිර්මාණයෙන් දක්වේ.
- වර්ණ හා ගැඹුරු රේඛා සංයෝජන ද චිත්‍රයේ ප්‍රකාශනය තීව්‍ර කිරීමට මැනැවින් පාදක වී ඇත.
- තෙල් සායම් මාධ්‍ය භාවිත කොට කැන්වසය මත නිර්මාණය කරන ලද මෙම සිතුවම දැනට නිව්යෝර්ක්හි නූතන කලා කෞතුකාගාරයේ (Museum of Modern Art) නිත්‍ය ප්‍රදර්ශනයට තබා ඇත.

- පැබ්ලෝ පිකාසෝ විසින් 1937 දී නිර්මාණය කළ ගුවර්නිකා නම් චිත්‍රය සඳහා වස්තු විෂය වී ඇත්තේ 2 වන ලෝක යුද සමයේ දී ගුවර්නිකා නම් නගරයට බෝම්බ හෙළීමේ සිදුවීම යි.
- යුද්ධයේ බිහිසුනු බව දැක්වෙන ප්‍රබල හා විශිෂ්ටතම නිර්මාණයක් වශයෙන් මෙම නිර්මාණය සැලකිල්ලට ලක්ව ඇත.
- යුද්ධයේ අත්දැකීම් අනුව අඳින ලද මෙම නිර්මාණයෙන් හුදෙකලා බව, වැළපීම්, යුක්තිය ඉල්ලා මොරදීම, මළවුන් වැළැඳ ගැනීම ආදී හැඟීම් රාශියක් මැනැවින් ප්‍රකාශ කර තිබේ.
- චිත්‍රයේ හැඟීම් ප්‍රකාශ කිරීම සඳහා පිකාසෝ විසින් යොදන ලද මානව හා සත්ත්ව රූපවල විවිධ කොටස් මැනවින් සංරචනය කර ඇත.
- සංරචනය කරන ලද රූප අතර අශ්ව, ගව හා ස්ත්‍රී පුරුෂ රූ කොටස් මෙන්ම විදුලි බල්බයක කොටස් වන අතර මෙම රූප සුන්බුන් වූ කොටස් ලෙස සම්පිණ්ඩනය කර ඇත.
- චිත්‍රය සඳහා භාවිත රූප ඝනිකවාදි හැඩයන්ගෙන් යුක්ත විය. එම ඝනික හැඩ බාහිර කායික සුන්දරත්වය වෙනුවට අභ්‍යන්තර හැඟීම් මැනැවින් ප්‍රකාශ කිරීමට සමත්ව ඇත.
- පැතලි තලයක් මත විවිධාකාර හැඩතල සංරචනය කර ඇත්තේ, ශාස්ත්‍රාලයීය යථාර්ථවාදී කලාවේ දක්වන පර්යාලෝක හා ත්‍රිමාන ලක්ෂණවලට වඩා වෙනස්ව ය. එනම් විෂයානුගත වන ආකාරයෙනි.

- සීමිත වර්ණ මාලවක් වන අළු, සුදු, කළු පැහැති වර්ණ පමණක් භාවිත කරමින් චිත්‍රයේ ඒකවාර්ණිකත්වයක් ගොඩනගා ඇත.
- හැඩතල හා වර්ණ ආදිය හේතු කොට ගෙන මෙම චිත්‍රය ඝනිකවාදී ශෛලියට අයත් වේ.
- අධිතාත්විකවාදී කලා ලක්ෂණ ද මෙම නිර්මාණයෙන් දැකිය හැකි ය.
- සෙන්ටිමීටර් 135X275 වන ප්‍රමාණයෙන් යුතු තෙල් සායම් මාධ්‍ය භාවිත කරන ලද මෙම විශිෂ්ට කැන්වස් නිර්මාණය වර්තමානයේ ස්පාඤ්ඤයේ මැඩ්රිඩ්හි කලාගාරයක ප්‍රදර්ශනයට තබා ඇත.

ඉගෙනුම් ආධාරක

https://www.youtube.com/watch?v=JL7s6-boEtM

https://www.youtube.com/watch?v=nU1kTVqJN4w

https://www.youtube.com/watch?v=mdIZ_1K_I7A